

සිතුවම ශ්‍රියා කුමාරසිංහ


සංස්කරණය/Editor
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

තාක්ෂණ සහය
දසුන් ගජමන් Dasun Gajaman

සන්නස පිරිවර
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

වර්ණ සංයෝජනය
ඉනෝකා දිසානායක

සම්බන්ධීකරණය



NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananada Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandta Eeriyagama

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
22 Lorne Street
Lalor Vic 3075 Australia
Web: www.sannasa.net
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



## ලියා දන්වන වග යි

### හැකියාව සහ ඕනෑකම

කිසිදු ප්‍රසිද්ධියක් හෝ වෙනයම් ලාභාපේක්ෂාවක් නොපතා ශ්‍රී ලංකාවේ දුප්පත් දරුවනට උදව් උපකාර කරන ශ්‍රී ලාංකිකයෝ අපට බොහෝ විට හමු වෙති. ශ්‍රී ලංකාවේ එක්තරා විශ්ව විද්‍යාලයක ඉගෙනුම ලබන ආර්ථික අතින් පහත් අඩියක සිටින දක්ෂ ශිෂ්‍යයන් දෙදෙනෙකුට මාස්පතා මුදල් යවන මගේ හිතවතෙකු වැදගත් කතාවක් කීවේ ය.

''මම ඉගෙන ගත්තෙ ලංකාවෙ නිදහස් අධ්‍යාපනයට පින් සිද්ධ වෙන්න. එහෙම ඉගෙනගෙන අද මම සේවය කරන්නෙ වෙනත් රටකට. මගේ රටට මගෙන් යමක් වුණේ නෑ නේද කියන දේ මගේ හිතට වද දෙනවා. අනෙක් අතින් මං ඒ කාලෙ ඉගෙන ගන්න කොයි තරම් දුක් වින්ද ද කියන එකත් මතක් වෙනවා. ඒ නිසයි මං මට පුලුවන් හැටියට මේ ළමයි දෙන්නට යම් මුදලක් යවන්නෙ.''

අනෙකෙකුට උදව් කිරීමේ සත් ක්‍රියාවෙන් සතුටු වන බොහෝ අය සිටිති. සිය මව් බිමෙන් බැහැරව ආර්ථික අතින් ස්ථාවර තත්ත්වයක සිටින කෙනෙකුට මව්බිමේ දරුවකුගේ අධ්‍යාපනය සඳහා සුලු මුදලක් යැවීමට නොහැකියාවක් නැත. අවශ්‍ය වන්නේ ඒ සඳහා ඇති ඕනෑකම පමණකි.

### විදෙස් ගත සිංහල සාහිත්‍යය

විදෙස් ගත වී සිට සිංහල සාහිත්‍යකරණයේ යෙදෙන්නවුන් දෙස වපරැසින් බැලූ යුගයක් විය. සිය මවුබිමේ අත්දැකීම් නිසි ලෙස ග්‍රහණය කර නොගෙන නිර්මාණරණයේ යෙදෙන්නන් ලෙස ඔවුන් වර්ග කෙරුණි.

එහෙත් අද වන විට ඒ සියල්ල වෙනස් වී ඇත. නවීන තාක්ෂණය හමුවේ විශ්වය ගම්මානයක් වී ඇත. විදෙස්ගත ශ්‍රී ලාංකිකයා සමහර විටෙක මව්බිමේ පය තබා සිටින ශ්‍රී ලාංකිකයාටත් වඩා මව්බිම සමීපයේ සිටිනු අපට පෙනෙයි. ශ්‍රී ලංකාවේ සිදුවන සියල්ල විනාඩි කීපයක් ගත වන්නට පෙර විදෙස්ගත ශ්‍රී ලාංකිකයා දැන ගනියි. සමහර විට මව්බිමේ වෙසෙන්නන් නොදැනගන්නා බොහෝ දේත් ඔහු දැනගනියි. මේ පරිසරය තුළ වැඩි වැඩියෙන් සිංහල සාහිත්‍ය කෘති බිහිවෙනු අපි දකිමු. එය සතුටකි.

අන්තර්ජාලයේ ව්‍යාප්තියත් සමගින් නිර්මානකරුවනට තමන් පය තබා සිටින ස්ථානය පිළිබඳ වැදගත් කම ක්ෂය වෙමින් ඇත. විවිධ රටවල සිටින සිංහල නිර්මාණකරුවන් අද අන්තර්ජාලය ඔස්සේ එකිනෙකා හා සංවාදයේ යෙදෙමින් අදහස් හා අත්දැකීම් හුවමාරු කරගනු අපි ආශ්වාදයෙන් බලා සිටිමු.

ලෝකය තවත් කුඩා විය යුතුම ය.



### වප් මඟුලයි ගමයි රටයි

රජවරු මහමැති සහ පිරිවැරුවෝ
කුඹුරට බැස සීසා මුල පිරුවෝ
මඩ සෝදා ගත් මේ රජ දරුවෝ
නව ලොවකට ජයමඟ හෙළි කෙරුවෝ

සරුපස පෙරළා වපුරා අල්ලක්
කමතින් කුඹුරට පුරවයි මල්ලක්
හැම අතකම දිස්වෙයි නව නිල්ලක්
ගෙන දෙයි ජාතියටම සැනසිල්ලක්

එක් සේසත් කෙරුමට පෙර ජාතිය
අහරින් සරු විය යුතු යන නීතිය
ගරු කොට දැයටම ගෙන දී ජෝතිය
නිසැකව දුරවාලිය හැක භීතිය

වැව දාගැබ වෙත ගත සිත නතුවී
ගම පන්සල සැදුණා පින සතුවී
වප් මහ ගොවි මංගල්ලෙන් මතුවී
ගම්මානය බැඳුණා එකමුතුවී

පෙරදිග ලොවටම හෙළ බත සැපයූ
අස්වනු සරුවී රන්මිළ ඉපයූ
වැඩි වැඩියෙන් සියරට දේ නිපයූ
යුගයක් වෙත යා යුතු ලොව ඇගයූ

ජගත් වෙත්තසිංහ
මෙල්බන්

## කවි කොළය

කොටි ගනුදෙනුව ගැන රට කරවන ඇත්තෝ
අහලා තමිල් සෙල්වම්ගෙන් සාස්තරේ
පත්තරවලට දාලා පොල්ගෙඩි අකුරින්
ඒ චෝදනාවෙන් නිදහස් වූ වගය

දී කිරි වලට බළලුන්ගේ සාක්කිය
ඕනෑ කරන්නෙත් ඇත්තට එහෙව් රටේ
අහලා සාස්තර හොරකුගෙ අම්මාගෙන්
සනසා ගනිමු කොයි කාගෙත් චින්තනය

වෙත්තසිංහ

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## සන්නස

සෑම මාසයකම 15 වන දා නිකුත් වෙයි